# ශ්‍රී ලංකා විගණන සේවා සංගමය
# இலங்கை கணக்காய்வுச் சேவை சங்கம்
# Sri Lanka Audit Service Association

ජාතික විගණන කාර්යාලය, අංක: 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.


මගේ අංකය: / எனது இல: / My Ref No: SLASA/2020/CA

ඔබේ අංකය: / உமது இல: / Your Ref No:

දිනය: / திகதி: / Date: 2020 සැප්තැම්බර් 09 දින

ගරුතර මහාසංඝරත්නය ඇතුළු අන්‍යාගමික පූජකතුමන්ලා, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීන්, වෘත්තීය සමිති නායකයින්, මාධ්‍ය ආයතන ප්‍රධානීන් හා දේශහිතෛෂී පුරවැසියන් වෙත,

**<u>යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුලින් පාර්ලිමේන්තු රාජ්‍ය මූල්‍ය පාලන බලය සීමා වීම හා විගණකාධිපතිවරයාගේ විෂය පථය සීමා වීම හේතුවෙන් එන අහිතකර බලපෑම.</u>**

01. ජාත්‍යන්තර හා ජාතික අවශ්‍යතාවක් ලෙස ඉස්මතු වන රාජ්‍ය විගණනයේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය ස්ථාපිත කිරීම වෙනුවෙන් බිහි වූ විගණන සේවා කොමිෂන් සභාව යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කිරීමට යෝජිතව ඇත. එහෙත් උක්ත කොමිෂන් සභාව වෙත පැවරී තිබූ කාර්යභාරය ඉටු කිරීම සඳහා සුදුසු ආයතනික ව්‍යුහයක් 20 වන සංශෝධන තුල ඇතුලත් කර නොමැත. එබැවින් රාජ්‍ය විගණනයේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය ඇති කල හැකි ආකාරයට පාර්ලිමේන්තුව තුල උචිත ව්‍යුහයක් සකස් කිරීමේ අවශ්‍යතාවය කාරුණිකව පෙන්වා දෙමු. (යෝජිත ව්‍යවස්ථා සංශෝධනය තුළින් රාජ්‍ය මූල්‍ය පාලනයට වන බලපෑම සම්බන්ධ විස්තර - ඇමුණුම 01)

02. රාජ්‍ය සමාගම් පෞද්ගලික විගණන සමාගම් මගින් විගණනය කිරීම හා විගණන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් පාර්ලිමේන්තු මූල්‍ය පාලනයෙන් බැහැර වීම, උක්ත සමාගම් තුල හෙලිදරව් නොවූ වැරදි වංචා මාධ්‍ය මගින් අනාවරණය වීම යන කරුණු සැලකිල්ලට ගෙන රාජ්‍ය සමාගම් විගණකාධිපතිවරයා විසින් විගණනයට ලක් කල යුතු බවට154(1) ව්‍යවස්ථාව තුල ඇතුලත්ව තිබූ වගන්තිය, 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉවත් කිරීමට යෝජිතව ඇත. රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තු කාර්යභාරය හා රටේ මහජන අපේක්ෂාවන් ඉටු කිරීමට හා ඒකී ආයතනයන්හි ගනුදෙනුවල පාරිශුද්ධභාවය සම්බන්ධ පරීක්ෂා කිරීම සඳහා පවතින යාන්ත්‍රණය සඳහා දැඩි හානියක් සිදුවිය හැකි බැවින් උක්ත සංශෝධනය වර්තමාන රජයේ ප්‍රතිපත්ති හා සමපාත නොවන බව කාරුණිකව දන්වමු. (රාජ්‍ය සමාගම් විගණනය සම්බන්ධ විස්තරාත්මක තොරතුරු - ඇමුණුම 02)


ගරු සභාපති: ඊ.ඒ.ඩී. ප්‍රසාද් ප්‍රසන්න
Hon President: E.A.D. Prasad Prasanna
Tel : 0714273573
Email: prasannaead@gmail.com

ගරු ලේකම්: ආර්.එම්.පී.ඒ.ජානක
Hon Secretary: R.M.P.A.Janaka
Tel : 0718464654
Email: a.rmpa@yahoo.com

03. උක්ත 154 (1) ව්‍යවස්ථාව තුලින් විගණකාධිපතිවරයා විගණනය කල යුතු බවට සඳහන්ව තිබූ පහත ආයතන, යෝජිත 20 වන සංශෝධනය තුලින් ඉවත්කර ඇත.

- රාජ්‍ය කොමිෂන් සභාව
- පොලිස් කොමිෂන් සභාව
- අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල
- අග්‍රාමාත්‍ය කාර්යාලය
- ජනාධිපති කාර්යාලය

උක්ත ආයතන 154 (1) ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම තුලින් විධායකයේ ප්‍රධාන නිලයන් හා ස්වාධීන කොමිෂන් සභාවල ගණන්දීමේ වගකීම් නිසි ලෙස ඉටු කර ඇත්ද යන්න විගණකාධිපතිවරයාගේ පරික්ෂාවට ලක් නොවන බවට පොදු මහජනතාව අතර බරපතල සැකයක් මතුවිය හැකි බව පෙන්වා දෙනු කැමැත්තෙමු.

04. රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව තුල විගණකාධිපතිවරයා රජයේ නිලධාරියෙකු නොවන බවට සඳහන්ව තිබූ වගන්තිය යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් ඉවත් කර තිබීම හේතුවෙන් විගණන කටයුතු සම්බන්ධ පාර්ලිමේන්තු කාර්යභාරය හා විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය අභියෝගයට ලක් වී ඇති බව පෙන්වා දෙමු.

උක්ත සංශෝධනයන් රාජ්‍ය විගණනයට අදාල ජාත්‍යන්තරව පිලිගත් සම්මුතීන්, සම්ප්‍රදායන් හා පරිචයන්ට අනුකූල නොවන බැවින්ද, උක්ත සංශෝධනයන්, මහජන අපේක්ෂාවන් හා වර්තමාන රජයේ ප්‍රතිපත්ති අතර ගැටුමක් ඇති කරන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව හා 170 වන ව්‍යවස්ථාව සංශෝධනය නොකරන ලෙසත් විගණන සේවා කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍යය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව තුල සුදුසු ආකෘතියක් සකස් කරන ලෙසත් කාරුණිකව ඉල්ලමු.

ස්තුතියි
විධායක සභාවේ අණ පරිදි

ආර්.එම්.පී.ඒ. ජානක
ගරු ලේකම්

**ඇමුණුම - 01**

## රාජ්‍ය මූල්‍ය පාලනය හා සම්බන්ධිතව පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුව්‍යවස්ථා 20 වන ව්‍යවස්ථා සංශෝධනය සමඟ සංසන්දනය

| ව්‍යවස්ථාව ට යොමුව | පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන | යෝජිත 20 වන ව්‍යවස්ථා සංශෝධනය | යෝජිත 20 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව රාජ්‍ය මූල්‍ය පාලනයට සිදුවිය හැකි බලපෑම් |
|---|---|---|---|
| 153(1) | විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා සුදුසුකම් ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේය. | විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේය. | විගණකාධිපතිවරයාගේ සුදුසුකම් ඉවත්කිරීම හා පත් කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම හේතුවෙන් රාජ්‍ය විගණනය ක්‍රියාත්මක කිරීම සඳහා විගණකාධිපතිවරයා සතුවිය යුතු ජාත්‍යන්තරව පිළිගත් පූර්ව අවශ්‍යතාවයන් වන ස්වාධීනත්වය, වෘත්තීය දක්ෂතාවය, සුදුසුකම් හා පළපුරුද්ද ඉවත් කිරීම. එමගින් විගණකාධිපතිවරයා පත් කිරීමෙන් බලාපොරොත්තු වන මහජන අවශ්‍යතාවය ඉටු නොවිය හැකි වීම. |
| 153:4 | විගණකාධිපතිවරයාට සිය ධූරයෙහි කාර්ය ඉටුකිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේය. | විගණකාධිපතිවරයාට සිය ධූරයෙහි කාර්ය ඉටුකිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේය. | |
| 153අ | (1) (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් පැවතිය යුතු අතර එකී කොමිෂන් සභාව එකී සභාවේ සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්ද සමන්විත විය යුත්තේය:-<br>(අ) නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධූරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් නිලධරයන් දෙදෙනෙකු;<br>(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයකු; සහ<br>(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාමලත් 1 වන පන්තියේ නිලධරයකු.<br><br>(2)(අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකු -<br>(i) ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් කලින් ඉල්ලා අස්වුවහොත්;<br>(ii) මේ පනත විධිවිධාන සලසා ඇති පරිදි ධූරයෙන් ඉවත් කළහොත්;<br>(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් | ඉවත් කර ඇත. | රාජ්‍ය විගණනයේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය ඇති කිරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කර ඇත. එමගින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සම්මුතීන් (ලීමා ප්‍රකාශනය, මෙක්සිකෝ ප්‍රකාශනය) හා මූලධර්ම වලට අනුකූලව, දේශීය හා ජාත්‍යන්තර ආයතන හා සිවිල් සංවිධාන වල අදහස් ඇතුළත්ව පුළුල් මහජන නියෝජනයකින්, පාර්ලිමේන්තුවේ සියලු පක්ෂවල එකඟතාවයකින් සම්මත කරන ලද ජාතික විගණන පනත ක්‍රියාත්මක කිරීම ගැටලු සහගත වේ. මේ මඟින් රාජ්‍ය විගණනයේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය නැති වීම, විගණන විෂය පථය සීමා වීම, රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය දුර්වල වීම හා රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය ද සීමා වීම වැනි අහිතකර ප්‍රතිවිපාක ඇති විය හැක. රාජ්‍ය මූල්‍ය කටයුතු සඳහා සම්බන්ධිත නිලධාරීන්ගේ වංචාව, දූෂණය, නොසැලකිල්ල හෝ සාවද්‍ය පරිහරණය හේතුවෙන් රජයට සිදුවන පාඩු අයකරගැනීමේ ක්‍රමවේදය අකර්මන්‍ය වීම. |

| | | | |
|---|---|---|---|
| | සහා සභිකයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු හෝ වුවහොත්,<br>මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධූර දැරිය යුත්තේය.<br><br>(ආ)කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ තැනැත්තෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත වැඩිදුර ධූර කාලයක් සඳහා පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේය.<br><br>(3) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව<br>(1) වන අනු ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේය.<br><br>(4) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැක්කේය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධූර කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුත්තේය.<br>(5) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් IX පරිච්ඡේදය වන දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එකී කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුත්තා හ.<br><br>(6) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයකු සිටිය යුත්තේය. | | |
| 153ආ | (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය එකී සභාවේ සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.<br>(2) පාර්ලිමේන්තුව විසින්, (1) වන අනුව්‍යවස්ථාවට යටත්ව කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා ද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත කිරීම සඳහා ද ඒ සඳහා සම්බන්ධිත වූ සහ අනුශංගික වූ වෙනත් කාරණා ද සඳහා විධිවිධාන සැලැස්විය යුත්තේ ය. | ඉවත් කර ඇත. | |
| 153ඇ | (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස්කිරීම, මාරුකිරීම්, විනය පාලනය කිරීම් සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාවට පැවරෙන්නේය.<br>(2) කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල, කාර්යය සහ කර්තව්‍ය ද ක්‍රියාත්මක කිරීම, | ඉවත් කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| | ඉටුකිරීම සහ කිරීම, කළ යුත්තේ ය:-<br><br>(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, ඔවුන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම්වලට අදාළ රීති ඒවාට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව සකස් කිරීම;<br>(ආ) නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම; සහ<br>(ඇ) නීතිය මගින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම.<br><br>(3) (2) වන අනු ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.<br>(4) එවැනි සෑම රීතියක්ම එසේ පළ කරන ලැබූ දින සිට හෝ එම රීති මඟින් නිශ්චිතව දක්වා ඇති යම් පසුබිමක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.<br>(5) එවැනි සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර එමඟින් පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුත්තේ ය. | | |
| 153ඇ | (1) තමාගේ රාජකාරී ක්‍රියාවලියේ දී නොවන අවස්ථාවක දී තමන් විසින් හෝ වෙනත් තැනැත්තකු හෝ මාර්ගයෙන්, කවර වූ හෝ ආකාරයෙන් කොමිෂන් සභාවේ තීරණයකට හෝ එකී සභාවේ යම් සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ යම් නිලධරයකුට හෝ බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත්කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේදී රුපියල් එක් ලක්ෂයට නොවැඩි දඩයකට හෝ අවුරුදු 03 කට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාර ගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත්විය යුතු ය.<br>(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකටම (1) වන | ඉවත් කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| | අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය. | | |
| 153ඉ | 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය පිරිනමා ඇති අධිකරණ බලයට සහ 153උ ව්‍යවස්ථාව යටතේ පරිපාලනය අභියාචන විනිශ්චය අධිකාරියට ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව, මේ පරිච්ඡේදය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ දී එකී සභාව විසින් දෙන ලද යම් නියමක් හෝ කරන ලද යම් තීරණයක් ගැන විභාග කිරීමට, ප්‍රකාශ කිරීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය. | ඉවත් කර ඇත. | |
| 153ඊ | කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය. | ඉවත් කර ඇත. | |
| 153උ | කොමිෂන් සභාව විසින් තමන් සම්බන්ධයෙන් වූ යම් පත්කිරීමකට, උසස් කිරීමකට හෝ ස්ථාන මාරුවකට අදාළව කරන ලද යම් නියමයකින් හෝ විනය පිළිබඳ කාරණයක් මත හෝ සේවයෙන් පහ කිරීමක් මත කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධව 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කිරීම කළ හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට හෝ ස්ථිර කිරීමට එකී විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය. | ඉවත් කර ඇත. | |
| 153ඌ | කොමිෂන් සභාව එකී කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය. එසේම සෑම ලිත් වර්ෂයකදී ම එහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ ය. | ඉවත් කර ඇත. | |
| 154(1) | විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියළු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41අා ව්‍යවස්ථාවේ උප ලේඛනයේ | විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියළු දෙපාර්තමේන්තුවල ගිණුම් ද, අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලයේ, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලවල, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ සහ මැතිවරණ කොමසාරිස්වරයාගේ | විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කර තිබූ රාජ්‍ය ආයතන විගනණයෙන් ඉවත් කිරීම මගින් එම ආයතන වල කටයුතු සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවෙහි සඳහන් රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු පාලනයෙන් බැහැර වීම. |

| | | | |
|---|---|---|---|
| | සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සළකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය. | කාර්යාලයේ පළාත් පාලන ආයතන කාර්යාලවල, රාජ්‍ය සංස්ථා කාර්යාලවල ගිණුම් ද සහ යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇති වෙළඳ ව්‍යාපාරවල හෝ වෙනත් ව්‍යාපාරවල ගිණුම් ද විගණනය කළ යුත්තේ ය. | 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රාජ්‍ය විගණනයට යටත් කරන ලද රාජ්‍ය සමාගම් 117ක් ඉවත් කිරීම මඟින්එම සමාගම්හි පවතින රු.මි. 743,000 රාජ්‍ය වත්කම් හා රු.මි.324,713ක් වූ වාර්ෂික ආදායම් රාජ්‍ය විගණනයෙන් ඉවත් කිරීම මඟින් එම ආයතන සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවෙහි සඳහන් රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු පාලනයෙන් ඉවත් වීම. |
| 154(2) | (2) මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද එවැනි යම් [103] [(1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය රාජ්‍ය සංස්ථාවක, වෙළඳ ව්‍යාපාරයක, වෙනත් ව්‍යාපාරයක හෝ සමාගමක] ගිණුම් විගණනය කිරීම සඳහා, ඒ [103] [(1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය සංස්ථාව, වෙළඳ ව්‍යාපාරය, වෙනත් ව්‍යාපාරය හෝ සමාගම] භාර අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා විගණකාධිපතිවරයා විමසා සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කළ හැක්කේය. එවැනි පත් කිරිමක් අමාත්‍යවරයා විසින් කරනු ලැබූ විට ඒ විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවය එම[103] [(1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය සංස්ථාව, වෙළඳ ව්‍යාපාරය, වෙනත් ව්‍යාපාරය හෝ සමාගම] සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව, විගණකාධිපතිවරයා විසින් ඒ විගණකවරයාට හෝ විගණකවරයන්ට ලියවිල්ලකින් දැන්විය හැකි අතර, එසේ දන්වනු ලැබූ විට ඒ විගණකවරයා හෝ විගණකවරයන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.<br>(3) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලබන්නාවූ කාර්ය සහ කර්තව්‍ය ද විගණකාධිපතිවරයා විසින් ඉටු කළ යුත්තේ ය.<br>4(අ) විගණකාධිපතිවරයා විසින්, තම කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා, තම මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු, සුදුසුකම් ලත් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ හෝ සේවය ලබාගත හැක්කේ ය.<br>(ආ) විගණනයට අදාල යම්කිසි තාක්ෂණික වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටළුවක් පරික්ෂා කිරීමේ දී -<br>(i) ගිණුම් විගණනය කරනු ලබන්නේ යම් | ඒ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ "(1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය රාජ්‍ය සංස්ථාව, වෙළඳ ව්‍යාපාරය, වෙනත් ව්‍යාපාරය හෝ සමාගම" යන වචන හා ඉලක්කම යෙදෙන කවර හෝ තැනක ඒ වචන හා ඉලක්කම වෙනුවට "රාජ්‍ය සංස්ථාව, වෙළඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය " යන වචන ආදේශ කිරීමෙන්; | |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවක, පුද්ගල මණ්ඩලයක හෝ අධිකාරයක ද, ඒ දෙපාර්තමේන්තුවේ, පුද්ගල මණ්ඩලයේ හෝ අධිකාරයේ සේවා නියුක්තයෙකු නොවන තැනැත්තකුගේ; හෝ<br>(ii) එකී දෙපාර්තමේන්තුවේ, පුද්ගල මණ්ඩලයේ හෝ අධිකාරයේ කටයුතු කළමනාකරණයෙහි ලා කවර හෝ සම්බන්ධතාවක් ඇති ආයතනයක් නොවන යම්කිසි තාක්ෂණික හෝ වෘත්තීය හෝ විද්‍යාත්මක ආයතනයක,<br>සහය ලබාගැනීම අවශ්‍ය බව විගණකාධිපතිවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එපරිද්දෙන් ඒ සේවය ලබා ගත හැක්කේ ය.<br>තව ද, ඒ තැනැත්තා හෝ ආයතනය විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.<br>(5)(අ) විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලත් කවර හෝ තැනැත්තකුට, තම කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී -<br>(i) සියළු පොත්පත්, වාර්තා, වාර වාර්තා සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමේ ද;<br>(ii) ගබඩාවලට සහ වෙනත් දේපළ වලට පිවිසීමේ ද;<br>(iii) එකී කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු ලබාගැනීමේ ද, කරුණු පැහැදිලි කරවා ගැනීමේ ද,<br>හිමිකම ඇත්තේ ය. | | |
| 154(5)ආ | [104] [යම් රාජ්‍ය සංස්ථාවක හෝ වෙළඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක හෝ (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් සමාගමක] හෝ ගිණුම් විගණනය කිරීම සඳහා පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකුටම නැතහොත් ඔහුගේ අධිකාරය ලත් සෑම තැනැත්තකුට ම, ඒ[104] [ රාජ්‍ය සංස්ථාව හෝ වෙළඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය හෝ (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් සමාගම] සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පිවිසීමකට, තොරතුරු ලබා ගැනීමකට සහ කරුණු පැහැදිලි කරවා ගැනීමකට එවැනිම හිමිකමක් ඇත්තතේ ය.<br>(6) විගණකාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තමන්ට අයත් කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස දහයක් ඇතුළත දී සහ අවශ්‍ය යයි ඔහු සළකන කවර වූ හෝ අවස්ථාවක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.<br>(7) මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ පත්කරන ලද සෑම සුදුසක්ම ලත් විගණකවරයකු ම විසින්, තම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි | (5) වන අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ “රාජ්‍ය සංස්ථාව හෝ වෙළඳ ව්‍යාපාරයක, වෙනත් ව්‍යාපාරයක හෝ (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් සමාගමක” යන වචන හා ඉලක්කම යෙදෙන කවර හෝ තැනක ඒ වචන හා ඉලක්කම වෙනුවට “රාජ්‍ය සංස්ථාව, වෙළඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය ” යන වචන ආදේශ කිරීමෙන්; සහ | |

| | | | |
|---|---|---|---|
| | පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුත්තේ ය.<br>(8) මේ ව්‍යවස්ථාවේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් -<br>(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ<br>(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ<br>අදහස් වේ. | | |
| 154(9) | [105] [(9) (8) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ විධිවිධාන, 153 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන විගණකාධිපතිවරයාට අදාල විය යුත්තේ ය. ] | ඉවත් කර ඇත. | |
| 170 | "රජයේ නිලධරයා" යන්නෙන් අධිකරණ නිලධරයෙකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධූරයක් දරන තැනැත්තෙක් අදහස් වේ; එහෙත් ඊට -<br>(අ) ජනාධිපතිවරයා;<br>(ආ) අග්‍රාමාත්‍යවරයා;<br>(ඇ) කථානායකවරයා;<br>(ඈ) අමාත්‍යවරයෙක්;<br>(ඉ) නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;<br>(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;<br>(උ)ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්;<br>(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(එ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඒ) මැතිවරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඔ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඕ) විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ක) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ග) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ච) මුදල් කොමිෂන් සභාවේ | "රජයේ නිලධරයා" යන්නෙන්, අධිකරණ නිලධරයෙකු හැර රජය යටතේ වැටුප් ලබන ධූරයක් දරන තැනැත්තෙක් අදහස් වේ; එහෙත් ඊට -<br>(අ) ජනාධිපතිවරයා;<br>(ආ)කථානායකවරයා;<br>(ඇ) 44 වන ව්‍යවස්ථාව හෝ 45 ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ අමාත්‍යවරයෙක්;<br>(ඈ) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඉ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඊ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා;<br>(උ) මැතිවරණ කොමිෂන් සභාව විසින්, මැතිවරණ කොමිෂන් සභාවට පත්කරනු ලැබූ නිලධරයන්;<br>(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(එ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඒ) නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;<br>(ඔ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;<br>(ඕ) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා;<br>(ක) ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයේ සාමාජිකයෙක්<br>(ග) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;<br>ඇතුළත් නොවන්නේය. | පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය පාලනය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ප්‍රමුඛ කාර්ය භාර්යයක් ඉටුකරනු ලබන විගණකාධිපතිවරයා රජයේ සේවකයෙකු ලෙස සැලකීමට යෝජනා කිරීම මඟින් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබන ආයතනවල හා එම ආයතනවල නිලධාරීන්ගේ හෝ එම ආයතන හරහා බලපෑම් කළ හැකි වෙනත් ආයතන හා පුද්ගලයන්ගේ බලපෑමට ලක්විය හැකි වීමෙන් එකී ව්‍යවස්ථාපිත තනතුරේ වගකීම් ඉටුකිරීම සඳහා පැවතිය යුතු ස්වාධීනත්වය ඉතා අහිතකර ලෙස බලපෑමට ලක්වීම. |

| | | | |
|---|---|---|---|
| | සාමාජිකයක්;<br>(ජ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ඩ)පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;<br>(ණ)පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;<br>(ත) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;<br>(ද) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්; සහ<br>(න) විගණකාධිපතිවරයා;<br>ඇතුළත් නොවන්නේය. | | |

**ඇමුණුම 02**

**රාජ්‍ය සමාගම් විගණනය**

1990 දශකයේ සිට ශ්‍රී ලංකාව තුල රාජ්‍ය සමාගම් බිහිවීම ආරම්භ වී ඇති අතර වර්තමානය වන විට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩල මගින් රාජ්‍ය සමාගම් 150 ක් පමණ (ඇමුණුම 03) ස්ථාපිත කර ඇත. මෙම සමාගම් සියල්ල සලකා බැලුවහොත් වාර්ෂික මෙහෙයුම් ධාරිතාවය දළ දේශීය නිෂ්පාදනයෙන් 2.1% ක් පමණ වන අතර වාර්ෂික පිරිවැය රාජ්‍ය වියදමෙන් 1.65% ක් පමණ වේ. රු. මිලියන 743,000ක පමණ වත්කම් රාජ්‍ය සමාගම් සතුව පවතී.

පසුගිය දශක 03 ක කාලය තුල රාජ්‍ය සමාගම් වල විගණනය පෞද්ගලික වරලත් ගණකාධිකාරි සමාගම් මගින් සිදු කරගෙන තිබුණි. උක්ත විගණනයන් මූල්‍ය ප්‍රකාශණ සඳහා මතයක් එලකිරීම සඳහා වූ මූල්‍ය විගණනයට සීමා වී තිබීම හේතුවෙන් කාර්යසාධනය හා රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලභාවය පරික්ෂාවට ලක් වී නොතිබුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රාජ්‍ය ප්‍රතිපත්ති නොසලකා විවිධ වරප්‍රසාද ලබා ගැනීමට හා සම්පත් භාවිතා කිරීමට තීරණයන් ගෙන ඇතත් පෞද්ගලික විගණන සමාගම් ඉදිරිපත් කරන විගණන වාර්තා තුල ඒකී තත්ත්වයන් අනාවරණය කර නොතිබුණි. උක්ත තත්ත්වයන් මාධ්‍ය මගින් අනාවරණය වීම සමඟ ඇති වූ සමාජ කතිකාව හේතු කොටගෙන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සමාගම් විගණකාධිපති තුමාගේ විෂය පථයට ඇතුලත් කරන ලදී.

2015 වර්ෂයේ සිට රාජ්‍ය සමාගම් විගණකාධිපතිතුමා විසින් විගණනය කොට විගණන වාර්තා ව්‍යවස්ථානුකූලව ඉදිරිපත් කල යුතු දිනයන්හීදී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර පොදු ව්‍යාපාර කාරක සභාව විසින් අදාල සමාගම් ප්‍රධානීන් කැඳවා අවශ්‍ය නිවැරදි කිරීම්ද සිදු කර ඇත. උක්ත වාර්තා තුලින් හෙලිදරව් කරගෙන ඇති ප්‍රධාන නිරීක්ෂණයන් කිහිපයක් ඇමුණුම 04 හි දක්වා ඇත.

විගණකාධිපතිවරයා විසින් විගණනයන් සිදු කිරීමේදී විනිවිදභාවය ඇති කිරීම හා රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා මඟ පෙන්වීම් සිදු කරනු ලබන අතර ආයතනයන්හි කාර්යභාරය ඉටු කිරීම අවහිරතා ඇති වන අයුරින් වෘත්තීය රාජ්‍ය විගණකයින් කිසි දිනක කටයුතු කර නොමැති නමුත් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූල නොවන සේ තීරණ ගැනීම, අවිධිමත් ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම මෙන්ම ප්‍රධාන තනතුරු දරන නිලධාරීන්ට විවිධ දීමනා සහ වරප්‍රසාද ලබා ගැනීම සඳහා උක්ත රාජ්‍ය සමාගම් වල ප්‍රධානීන්, රාජ්‍ය සමාගම් විගණන කටයුතු සිදු කරන ලද පෞද්ගලික විගණකයන් හා රාජ්‍ය සමාගම් වල ප්‍රධාන සැපයුම්කරුවන් ඒකාබද්ධව රාජ්‍ය විගණනය තුලින් ආයතනයන්හි ක්‍රියාකාරිත්වයට හා කාර්යසාධනයට අහිතකර බලපෑම් ඇතිවන බවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන පුද්ගලයින් මගින් මාධ්‍ය ප්‍රකාශ ලබා දීමට සංවිධානාත්මකව කටයුතු කරන බව හා අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රමාත්‍යතුමා මෙන්ම කැබිනට් මණ්ඩලය වෙත ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් රාජ්‍ය විගණනයේ කාර්යභාරය අවතක්සේරු කිරීමට කටයුතු කරන බව පෙන්වා දෙනු කැමැත්තෙමු.

විගණකාධිපතිතුමාගේ විගණනයට ලක් වී ඇති රාජ්‍ය සමාගම් පිළිබඳ විස්තර

ඇමුණුම **03**

| | Company Name | Total Revenue | Total Expenditure | Profit or Loss | | Total Assets | Total Liabilities |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2019 | | | |
| | | 2019 | 2019 | Profit | Loss | 2019 | 2019 |
| 1 | Ceylon Fertiliser Company Ltd | - | - | | | - | - |
| 2 | Colombo Commercial Fertilizers Ltd | - | - | - | - | - | - |
| 3 | Airport & Aviation Services (Sri Lanka ) (Pvt) Ltd. | 25,716,094,096 | 14,658,773,089 | 10,996,009,352 | - | 108,274,708,982 | 69,044,051,731 |
| 4 | Mihin lanka (pvt) Ltd. | - | - | - | - | - | - |
| 5 | Sri Lankan Airlines Ltd | 184,652,780,000 | 228,675,450,000 | - | 44,022,670,000 | 77,339,000,000 | 254,895,230,000 |
| 6 | Sri Lanka Catering Ltd. | 10,732,787,502 | 5,130,290,994 | 5,602,496,508 | | 12,589,673,559 | 3,102,947,095 |
| 7 | Lanka Hospitals Corporation Plc | 6,476,313,140 | 5,808,659,452 | 667,653,687 | - | 8,901,417,154 | 2,847,363,578 |
| 8 | Lanka Hospitals Dignosis (pvt) Ltd | 1,480,345,783 | 1,167,897,766 | 312,448,017 | - | 1,448,433,037 | 425,007,433 |
| 9 | NSB Fund Management Company LTD | 954,419,731 | 50,959,560 | 768,005,887 | - | 15,986,045,693 | 12,648,922,388 |
| 10 | Boc Travels (pvt) Ltd | 300,315,000 | 270,659,000 | 29,656,000 | - | 402,370,000 | 143,932,000 |
| 11 | Boc Property Development PLC | 1,290,746,282 | 394,056,701 | 896,689,581 | - | 4,443,630,389 | 706,556,730 |
| 12 | BOC Property Development Management (pvt) Ltd | 450,532,152 | 138,250,288 | 312,281,864 | - | 1,927,313,990 | 98,966,066 |
| 13 | Hotels Colombo 1963 Ltd | - | - | - | - | - | - |
| 14 | Ceybank Holiday homes (pvt) Ltd | 122,806,633 | 128,083,056 | - | 5,276,423 | 65,853,452 | 70,890,238 |
| 15 | BOC Management & Support Services (pvt) Ltd | 2 | 53,729 | - | 53,727 | 1,291,188 | 360,266 |
| 16 | Machent Bank of Sri Lanka & Finance PLC | 6,839,015,000 | 6,759,112,000 | 57,194,000 | - | 36,975,123,000 | 34,367,328,000 |
| 17 | People's Travels (pvt) Ltd | - | - | - | - | - | - |
| 18 | People's Leasing PLC | 33,599,314,000 | 30,656,806 | 2,942,508,000 | - | 171,660,193,000 | 141,413,561,000 |
| 19 | Management Services Rakshana (pvt) Ltd | 583,678,700 | 583,123,027 | 555,673 | - | 108,739,503 | 163,111,124 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 20 | Canwill Holdings (pvt) ltd | 9,435,080 | 9,931,740 | - | 496,660 | 18,883,814,642 | 32,110,007 |
| 21 | Sinolanka Hotel & Spa Pvt) Ltd | 12,582,592 | 5,145,765,375 | - | 5,133,182,782 | 22,887,517,789 | 5,577,874,954 |
| 22 | Helanco Hotels & Spa (pvt) Ltd | 39,142,280 | 4,003,549 | 35,138,732 | - | 683,974,038 | 17,881,539 |
| 23 | Canowin Hotels and Spa (pvt) Ltd | 170,798,242 | 91,371,668 | 79,426,574 | - | 1,173,897,099 | 142,543,091 |
| 24 | Sri Lanka Insuarance Coporation Ltd | 48,608,572,000 | 40,403,565,000 | 8,205,007,000 | - | 211,699,744,000 | 149,426,747,000 |
| 25 | Cricket Aid (Gurantee) Ltd | - | - | - | - | - | - |
| 26 | Lanka Building Materials Corporation Ltd | - | - | - | - | - | - |
| 27 | Central Engineering Services (pvt) Ltd | 10,580,744,430 | 10,565,635,599 | 206,852,047 | | 12,681,031,711 | 12,076,166,217 |
| 28 | Information & Communication Technology Agency Of Sri Lanka (pvt) Ltd. | - | - | - | - | - | - |
| 29 | Lanka Government Information Infrasture (pvt) Ltd | - | - | - | - | - | - |
| 30 | Sri Lanka Computer Emergency Response Team (pvt) Limited | - | - | - | - | - | - |
| 31 | Northsea Limited | | | | - | | |
| 32 | Manthai Salt Limited | - | - | - | - | - | - |
| 33 | Lakdiva Engineering Company (pvt) Ltd | - | - | - | - | - | - |
| 34 | Lanka Leyland (pvt) Ltd | - | - | - | - | - | - |
| 35 | Rakana Arakshaka Ltd | - | - | - | - | - | - |
| 36 | Lanka Logistic & Technologies Ltd | 200,657 | 134,231,635 | - | 134,030,978 | 13,417,749 | 59,099,145 |
| 37 | Distance Learning Center | - | - | - | - | - | - |
| 38 | Cey-Nor Foundation Ltd | 99,073,851 | 121,976,985 | - | 22,903,133 | 639,531,207 | 312,753,688 |
| 39 | Sri Lanka poultry Development company (pvt) Ltd | Not Received | Not Received | - | Not Received | - | - |
| 40 | Milco (pvt) Ltd | Not Received | Not Received | - | - | - | - |
| 41 | Mahaweli Livestock Enterprices Ltd | Not Received | Not Received | - | Not Received | Not Received | Not Received |
| 42 | Sri Lanka Thriposha Limited | 3,321,821,316 | 3,143,686,219 | 178,135,096 | - | 1,525,439,303 | 238,575,309 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 43 | Ocean View Development Company (pvt) Ltd. | 149,327,560 | 138,396,098 | 10,931,462 | - | 2,698,823,872 | 189,618,546 |
| 44 | Water's Edge Limited | | | - | - | - | - |
| 45 | Lanka Rest Houses (pvt) Ltd | 33,934,120 | 23,727,143 | 10,206,977 | - | 69,177,280 | 88,195,669 |
| 46 | Urban Investment & Development Company (Pvt) Ltd | 684,655,983 | 364,529,675 | 320,126,308 | - | 3,936,552,819 | 2,387,054,110 |
| 47 | Peliyagoda Warehouse Complex Company Ltd | - | | - | - | - | - |
| 48 | Land Reclamation & Development Company Ltd. | 234,419,964 | 283,394,102 | | 48,974,138 | 804,229,379 | 747,144,003 |
| 49 | LRDC Services (Pvt) Ltd | 2,188,280,130 | 2,112,017,496 | 76,262,634 | - | 1,010,640,643 | 712,221,497 |
| 50 | Natural Resours Management Services (pvt) Company Ltd | 717,910 | 2,306,957 | - | 1,589,941 | 7,509,643 | 1,053,143 |
| 51 | Mahaweli Live Stock & Agro Ltd | 61,441,335 | 70,112,508 | | 4,663,530 | 90,883,438 | 42,940,439 |
| 52 | Mahaweli consultancy Bereau Ltd | 0 | 0 | - | 0 | 0 | 0 |
| 53 | Mahaweli Venture capital (Pvt) Ltd | | 0 | - | - | 0 | 0 |
| 54 | GSMB Technical Services (pvt) Ltd | 194,791,438 | 141,256,666 | 53,534,772 | - | 504,660,454 | 202,687,861 |
| 55 | Lanka Gemological Laboratory (Pvt) Ltd | | | | | | |
| 56 | BCC Lanka | - | - | - | - | - | - |
| 57 | Paranthan Chemical | 325,646,375 | 252,265,648 | 73,380,727 | - | 793,890,376 | 131,730,113 |
| 58 | Lanka Phoshate | 546,327,194 | 528,549,719 | 17,777,475 | - | 905,035,010 | 117,270,430 |
| 59 | Lanka Mineral Sand | 4,045,352,989 | 1,767,606,938 | 2,277,746,050 | - | 5,294,501,665 | 1,940,208,932 |
| 60 | Lanka Salt Ltd | 1,567,174,191 | 1,916,374,623 | - | 349,200,431 | 1,842,185,807 | 800,624,878 |
| 61 | Sri Lanka Media Training Institute | - | - | - | - | - | - |
| 62 | Independent Television Network Limited | 1,142,797,022 | 1,894,534,118 | | 571,884,034 | 2,461,894,011 | 903,333,321 |
| 63 | Hotel Developers Lanka PLC | 2,910,267,000 | 3,235,897,000 | - | 325,630,000 | 16,605,325,000 | 1,579,615,000 |
| 64 | Associated News Papers Of Ceylon Ltd | 3,092,361,000 | 3,289,183,000 | - | 196,822,000 | 2,109,369,000 | 1,717,092,000 |
| 65 | Lake House Property Development (pvt) Ltd | - | 352,430 | - | 352,430 | 18,702,067 | 20,000 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 66 | Obsever Jobs (pvt) Ltd | - | 498,730 | - | 498,730 | - | - |
| 67 | Lake house Connect (Pvt) Ltd | - | 498,040 | - | 498,040 | - | - |
| 68 | National Paper Company Ltd | - | - | - | - | - | - |
| 69 | Kurunegala Plantation Ltd | 651,274,338 | 531,103,431 | 120,170,906 | - | 2,423,906,095 | 459,015,623 |
| 70 | Elkaduwa Plantation Ltd. | - | - | - | - | - | - |
| 71 | Kalubowitiyana Tea Factory Ltd. | 959,715,256 | 916,447,679 | 43,267,576 | - | 627,617,236 | 185,787,221 |
| 72 | Galoya Plantations (pvt) Ltd | - | - | - | - | - | - |
| 73 | Chilaw Plantation Ltd | 549,942,541 | 489,034,730 | 60,907,811 | - | 1,412,328,012 | 464,505,238 |
| 74 | Sri Lanka Rubber Manufacturing & Export Corporation Ltd | | | | | | |
| 75 | Lanka Sugar Company Ltd | - | - | - | - | - | - |
| 76 | Hingurana Sugar Industries Ltd | - | - | - | - | - | - |
| 77 | Kantale Sugar Indrustries Ltd | - | - | - | - | - | - |
| 78 | Ceylon Petrolem storage Terminals Ltd | 16,515,254,612 | 13,587,398,579 | 1,765,326,987 | - | 32,205,354,378 | 5,996,544,184 |
| 79 | Litro Gas Lanka Ltd | 44,719,625,153 | 41,193,606,468 | 3,526,018,684 | - | 30,043,978,698 | 14,110,122,789 |
| 80 | Litro Gas Termanal Lanka (pvt) Ltd | 2,766,967,293 | 1,321,479,562 | 1,445,487,731 | - | 12,173,505,057 | 2,385,789,545 |
| 81 | Lanka Coal Company Ltd | 42,480,493,671 | 42,480,493,671 | - | - | 3,677,721,659 | 3,578,627,377 |
| 82 | Daduru Oya Mini Hydro (pvt) Ltd | 454,341 | 3,781,647 | - | 3,327,306 | 71,527,333 | 31,023,221 |
| 83 | Kumbalgamuwa Mini Hydro (pvt) Ltd | 106,334,411 | 92,472,958 | 13,861,453 | - | 541,456,433 | 419,438,841 |
| 84 | Trincomalee Power Company Ltd | 1,678,478 | 15,378,710 | - | 13,700,232 | 70,220,727 | 1,319,567 |
| 85 | Sri Lanka Energies HR (pvt) Ltd | 20,282,776 | 18,406,342 | 1,876,435 | - | 180,708,237 | 56,094,118 |
| 86 | Sri Lanka Energies (pvt) Ltd | 401,307,802 | 360,606,857 | 40,700,945 | - | 488,433,684 | 442,206,364 |
| 87 | Koladeniya Hydro Power Company (pvt) Ltd | 107,122,844 | 45,313,902 | 61,808,942 | - | 474,335,657 | 156,975,414 |
| 88 | Lanka Electricity Company | 36,729,109,000 | 32,801,317,000 | 3,927,792,000 | - | 47,496,836,000 | 13,960,235,000 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 89 | Ante LECo Metering Company (PVT) Ltd | 1,251,926,790 | 1,179,960,777 | 71,966,012 | | 874,041,183 | 434,001,798 |
| 90 | LECO Projects (Pvt) Ltd | 520,691 | 379,545 | 141,146 | | 7,356,180 | 8,365,090 |
| 91 | West Coast Power (Pvt) Ltd (Ordinary) | 50,477,100,297 | 40,697,862,264 | 9,779,238,033 | | 71,403,226,552 | 11,926,729,451 |
| 92 | Jaya Container Terminal Ltd | 329,561,000 | 231,094,365 | 98,466,635 | - | 428,834,353 | 43,891,892 |
| 93 | Magampura Port Management (Pvt) Ltd | - | - | - | - | - | - |
| 94 | Sri Lanka Port Management & Consultancy Services (pvt) Ltd. | 107,262,314 | 94,071,921 | 13,190,394 | - | 248,305,557 | 77,650,343 |
| 95 | Ceylon Shipping Coporation | 0 | - | - | - | - | - |
| 96 | Manganaguma Road construction Equipment Company (pvt) Ltd | - | - | - | - | - | - |
| 97 | Manganaguma Consultancy & Project Management Services (pvt) Ltd | - | - | - | - | - | - |
| 98 | Lanka Cement | - | - | - | - | - | - |
| 99 | Sri Lanka Institute of Nanotechnology (pvt) Ltd | - | - | - | - | | - |
| 100 | Kahatagaha Graphhite Lanka Ltd | - | - | - | - | - | - |
| 101 | Lanka Salusala Ltd | - | - | - | - | - | - |
| 102 | CWE Economics Centers Services (pvt) Ltd | - | - | - | - | - | - |
| 103 | Lanka Sathosa Ltd | - | - | - | - | - | - |
| 104 | Sri Lanka State Trading (General ) Coporation | - | - | - | - | - | - |
| 105 | National Wealth coporation Ltd | 3,951,125 | 6,919,452 | - | 2,968,327 | 1,268,541,338 | 6,485,778 |
| 106 | National wealth Securaties pvt Ltd | 303,738,992 | 79,318,467 | 224,420,525 | - | 1,324,491,207 | 140,983,872 |
| 107 | CWE Construction Engineering (pvt) Ltd | - | - | - | - | - | - |
| 108 | Academy Of Financial Studies (Gurantee) Ltd. | 157,886,847 | 127,749,614 | 30,137,234 | - | 320,390,536 | 40,648,052 |
| 109 | CFC Founding (Guarantee) Ltd | 25,097,649 | 25,097,649 | 0 | 0 | 100,004,729 | 100,004,729 |
| 110 | Sri Lanka Youth Services (pvt) Ltd. | - | - | - | - | - | - |
| 111 | Skill Development Fund Ltd | 83,883,895 | 78,021,200 | 5,862,693 | - | 211,591,653 | 11,535,428 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 112 | Sri Lanka Foreign Employement Agency | 22,696,922 | 25,583,862 | | 3,015,782 | 196,812,423 | 54,606,224 |
| 113 | National School of Business Management Ltd | 3,034,167,953 | 2,909,038,284 | 125,129,669 | - | 10,929,098,333 | 10,057,223,076 |
| 114 | Heli Tours (Pvt) Ltd | - | - | - | - | - | - |
| 115 | Manganaguma Emulsion production company (pvt) Ltd | - | - | - | - | - | - |
| 116 | Expresway Transport Company (pvt) ltd | - | - | - | - | - | - |
| 117 | Shipping & Aviation information & Reach (pvt) Ltd | - | - | - | - | - | - |
| | total | 324,713,314,419 | 262,986,943,204 | 37,109,526,783 | 6,819,068,624 | 743,724,515,774 | 421,415,144,551 |

ඇමුණුම 04

<u>රාජ්‍ය සමාගම් විගණකාධිපතිවරයාගේ විෂයපථයට එක්වීමෙන් පසු විගණන වාර්තා මගින් අනාවරණය කර ඇති ප්‍රධාන නිරීක්ෂණයන්</u>

**01) 2009 වර්ෂයේ සිට 2016 ජූනි දක්වා නොරොච්චෝලේ ලක්විජය බලාගාරය සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම මගින් සිදු කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදන සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ ඉල්ලීම පරිදි විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව.**

ලංකා ගල් අඟුරු සමාගම විසින් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා 2009 ජූනි මාසයේ සිට 2016 ජූනි මාසය දක්වා ආනයනය කරන ලද ගල් අඟුරු මෙ.ටොන් 6,775,199 සම්බන්ධයෙන් විධිමත් ප්‍රසම්පාදන පටිපාටීන් අනුගමනය කර නොතිබුණි. එම අවිධිමත් මිලදී ගැනීම හේතුන් විවිධ අවස්ථාවන් වලදී විවිධ හේතුන් නිසා ලංකා විදුලි බල මණ්ඩලයට සිදු වූ පාඩුව රු.මිලියන 4,145ක් ලෙස අනාවරණය කරගන්නා ලදී

**02) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමේ ගුවන්යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව**

A 330 – 300 ගුවන්යානා 06 ක් සහ A 350 – 900 ගුවන්යානා 04 ක් මිලදී ගැනීම, තවත් A 350 – 900 වර්ගයේ ගුවන්යානා 04 ක් බදු පදනම මත ලබා ගැනීම හා ඉහත A 330 – 300 ගුවන්යානා 06 විකුණා නැවත ආපසු බදු පදනම මත ගැනීම සඳහා වූ තීරණ 2013 වර්ෂයේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ගෙන තිබූ අතර, ඒ සඳහා විධිමත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක්ද සිදුකර නොතිබුණි. තවද, සමාගම විසින් ඉහත ගුවන්යානා ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සඳහා උපදේශන සේවා ලබාගැනීමට සමාගම් තෝරාගැනීමේදී හා ගුවන්යානා මිලදී ගැනීමේදී හා බදු පදනමට ගැනීම සඳහා ආයතන තෝරාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

එමෙන්ම සමාගම ගුවන්යානා ඇණිය ප්‍රතිස්ථාපනය සඳහා උපදේශන සේවාව ලබා ගැනීම වෙනුවෙන් සීබරි උපදේශන සමාගමට 2012 සිට 2017 දක්වා කාලය තුල ගෙවන ලද එකතුව ඇ. ඩොලර් 1,116,413 එනම් රු. 144,887,459 ක මුදල ගුවන්යානා මිලදී ගැනීම් මූල්‍යායනය කිරීමේ සැලැස්මක් නොමැති වීම නිසා නිෂ්කාර්යය වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය. මෙම අවිධිමත් කළමනාකරණ තීරණ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක්වී ඇත.

**03)** **සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම විසින් 2013 හා 2014 වර්ෂයන්හිදී එළඹ තිබූ A350-900 ගුවන්යානා 08ක් අත්පත් කර ගැනීමේ ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉල්ලීම පරිදි විගණකාධිපති විසින් සිදු කළ පරීක්ෂණයේ අවසන් වාර්තාව**

ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම විසින් A 350-900 වර්ගයේ ගුවන්යානා 04 ක් මෙහෙයුම් කල්බදු පදනම මත ලබා ගැනීමට අදාල ගිවිසුම් ප්‍රමාණවත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව අවසන් කිරීම හේතුවෙන් ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම වෙත භාණ්ඩ හෝ සේවා ස්වරූපයේ කිසිදු කාලීන ප්‍රතිලාභයක් ලැබීමකින් තොරව ඇ. ඩොලර් මිලියන 115.77 ක් එනම් ශ්‍රී ලංකා රු. මිලියන 16,924.36 ක් 2016/2017 වර්ෂයේදී වන්දි වශයෙන් ගෙවා තිබුණි.

කෙසේ වුවද, වර්තමානය වන විට 2020 සහ 2021 වර්ෂවල ලැබීමට නියමිත A 350 – 900 ගුවන්යානා 04 ක් වෙනුවට A 321 නියෝ (NEOS) සහ / හෝ A 330 නියෝ ගුවන්යානා මිලදී ගැනීම සඳහා සමාගම සහ එයාර්බස් එස් ඒ එස් සමාගම අතර සාකච්ඡා පවත්වමින් තිබෙන අතර, මෙම වාර්තාවේ දිනය වනවිට ගුවන්යානා ලබාගැනීමේ පෙර ගෙවුම් ලෙස රු. මිලියන 2,528.12 ක් (එ.ජ.ඩො. මිලියන 19.21 ක්) එම සමාගම වෙත ගෙවා තිබුණි. එමෙන්ම ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගම A 350-900 වර්ගයේ ගුවන්යානා 04 හි මෙහෙයුම් කල්බදු ගිවිසුම් අවලංගු කරගැනීම නම් වූ ප්‍රධාන කාර්යය මුල් කරගනිමින් "Skyworks" හා "Nyras" යන උපදේශන සේවා ආයතන දෙකෙන් උපදේශන සේවා ලබාගැනීම වෙනුවෙන් වැය කළ රු.99,186,143ක් නිෂ්කාර්යය වියදමක් බවට පත්ව ඇති බව නිරීක්ෂණය විය. මෙම අවිධිමත් කළමනාකරණ තීරණ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක්වී ඇත.

**04)** **සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීම සහ එහි තිබූ යකඩ අලෙවි කිරීම පරික්ෂා කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව**

කර්මාන්ත ශාලාව ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුමට එවකට හිටපු නීති උපදේශක විසින් රජයට අවාසිදායක ලෙස කොටස් එකතු කර තිබීම හේතුවෙන් බේරුම්කරණ නඩුවේදී වන්දි වශයෙන් සිංගප්පූරු ඩොලර් 894,516 ක් හා ඇමරිකානු ඩොලර් 211,913 ක් ගෙවීම, කර්මාන්ත ශාලාවට අයත් මිල අධික යන්ත්‍ර සූත්‍ර රජයට අහිමිව වසර 25 කට වැඩි කාලයක් ආයතනය වසා දැමීම හේතුවෙන් දැනට කර්මාන්ත ශාලාවේ පවතින ඉහළ වටිනාකමින් යුත් වත්කම් විශාල ප්‍රමාණයක් භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වී තිබූ බව අනාවරණය කර තිබුණි. මෙම අවිධිමත් කළමනාකරණ තීරණ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක්වී ඇත.

**05)** **ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා එප්පාවල පොස්පේට් නිධිය උපරිම ධාරිතාවයෙන් භාවිතා කිරීම ඇගයීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව**

ශ්‍රී ලංකාව තුළ පාෂාණ පොස්පේට් නිධි දෙකෙන් ආර්ථික වශයෙන් වැඩි වැදගත්කමක් ඇති එප්පාවල පොස්පේට් නිධිය වර්ග කිලෝමීටර් 6 ක පමණ ප්‍රදේශයක පැතිර ඇති අතර මෙට්‍රික් ටොන් මිලියන 60 ක පමණ ධාරිතාවයකින් යුක්තය. මේ සඳහා 1992 වර්ෂයේදී සී /ස ලංකා

පොස්පේට් රාජ්‍ය සමාගම පිහිටු වීමෙන් පසු එහි කැනීම් කටයුතු එකී සමාගම විසින් කරගෙන යනු ලැබූ අතර, නිධිය සොයාගෙන දශක 5 ක් පමණ ඉක්ම ගොස් ඇතත් එය රටේ සංවර්ධනය සඳහා ප්‍රශස්ත ලෙස යොදාගැනීමට නොහැකි වී ඇති බවත්, මේවා ආනයනික Triple Super Phosphate වලට ආදේශකයක් ලෙස යොදාගතහොත් ආනයන සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කර ගත හැකි බවත්, අතිරික්ත නිෂ්පාදනය අපනයනය කිරීමෙන් විදේශ විනිමය ඉපයීමට ද හැකි බවත්, කැඩ්මියම් සහ ආසනික් ඉතාමත් ස්වල්ප ප්‍රමානයක් ඇති නිසා දැනට ව්‍යසනයක්ව පවතින වකුගඩු රෝගය මෙන්ම පිළිකා හා හෘදයාබාධද අවම කර ගත හැකි බවත් අනාවරණය කර තිබුණි. මෙම අවිධිමත් කළමනාකරණ තීරණ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක්වී ඇත.

**06) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනීම පිලිබඳ විශේෂ විගණන වාර්තාව**

2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබාගැනීම සඳහා 2010 වර්ෂයේදී ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබූ අතර, ඒ සඳහා සීඩබ්ලිව්ජී 2018 ( පෞද්ගලික ) නමින් රාජ්‍ය සමාගමක් සංස්ථාපනය කර තිබුණි. මෙම සමාගම සංස්ථාපනය කිරීමේ කටයුතු අමාත්‍ය මණ්ඩල තීරණ වලට පටහැනි ලෙස සිදු කිරීමත්, රාජ්‍ය අංශයේ කොටස් ප්‍රාග්ධනය සඳහා නිත්‍යානුකූලව කොටස් සහතික නිකුත් නොකිරීමත්, උපදේශකයන් තෝරාගැනීම සිදු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශකයන්ගෙන් බැහැරව කටයුතු කර තිබූ බවත් අනාවරණය කර තිබුණි. තවද ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීමට නොහැකි වූ අතර රැස්කරන ලද මුදල් කාර්යක්ෂමව හා ඵලදායි පරිදි උපයෝජනය නොකිරීම හේතුවෙන් රු.මිලියන 689.9 ක මූල්‍යමය අලාභයක් සිදු වී ඇති බව අනාවරණය කර තිබුණි. මෙම අවිධිමත් කළමනාකරණ තීරණ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක්වී ඇත.